# කියවීම් පත්‍රිකාව

- රාමසාන් උත්සවය (ඊදුල් ෆිත්ර්)ඉස්ලාම් ප්‍රජාවට සුවිශේෂ වූ උත්සවයකි.
- ඉස්ලාමීය දින දර්ශනයේ නව වන මාසය වන රමලාන් මාසයේ මුල් සඳ දුටු තැන් සිට දසවන මාසය වන ෂව්වාල් මාසයේ මුල් සඳ දක්වා දින 29 හෝ 30 ක් උපවාස කාලයකින් පසුව රාමසාන් උත්සවය එළඹේ.
- මෙකී උපවාස කාලය තුළ ලොව පුරා විසිරී සිටින මුස්ලිම් බැතිමත්හු ඉතා අධික භක්තියෙන් යුතු ව උපවාසයේ නියැලෙති.
- මෙකී උපවාසය "සව්ම්" යන අරාබි වහරෙන් හඳුන්වනු ලැබේ.
- උපවාසයේ දී අලුයම නැමදුම් (සලාත්) වේලාව ආරම්භ වීමට සුළු මොහොතකට පෙර සිට හිරු බැසයන කාලය වන තුරු කිසිදු ආහාරපාන ගැනීමක්, උපවාසය කඩවන දෙයක් කිරීමක් සිදු නොවේ.
- සව්ම් සමාදන් (උපවාසයේ යෙදීම) මගින් කුසගින්නේ කුරිරු බව අවබෝධ වීම නිසා දිළින්දන්ට පිහිටවීමේ ආකල්ප ඇතිවනවා පමණක් නොව ඔවුහු එය ක්‍රියාවට නැංවීමට ද පෙළඹෙති.
- එහෙයින් මෙම කාලයේ බහුල වශයෙන් "(Z)සකාත් යන අනිවාර්ය දානය ද "සදකා" යන අනිවාර්ය නොවන දානය ද මුස්ලිම්වරු විසින් දෙනු ලැබේ.
- "සව්ම්" නොහොත් උපවාසයේ යෙදීමේ දී සිත දමනය කර ජීවත් වීමට පුහුණුවක් ද ඉවසීමෙන් ජීවත් වීමේ හැකියාව ද ලැබේ. එමෙන් ම මෙමගින් මනුෂ්‍යා තුළ යහපත් ගුණදහම් වර්ධනය වන අතර යහපත් විනයක් පවත්වා ගැනීමට ද පුහුණුවක් ලැබේ.
- වයස අවු 10 ට වැඩි සියලුම් මුස්ලිම් පිරිමින් හා ස්ත්‍රීන්ට උපවාසය රැකීම අනිවාර්ය වේ. එහෙත් කුඩා දරුවන්, රෝගීන්, වයෝවෘධයන්, ගැබිනි මව්වරුන් හා කිරිදෙන මව්වරුන් සඳහා සහන/ විකල්ප ඇත.
- මුස්ලිම්වරු උපවාසයේ යෙදෙන කාලයේ වැඩි වශයෙන් යාඥා කරමින් (විශේෂයෙන්ම රාත්‍රී කාලයේ) හා ශුද්ධ වූ 'කුර්ආනය' පාරායනයේ (කියවමින්) පසුවෙති. 'අල්ලාහ්' දෙවියන්ගෙන් මේ සඳහා අධික ආනිශංස ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසය යි.
- නව සඳ දැකීමෙන් පසු උපවාස කාලය අවසන් වේ.
- උපවාස කාලය අවසන් වීමත් සමඟ මස්ජිදයට (දේවස්ථානයට) ගොස් යාඥා කර රාමසාන් උත්සවය පැවැත්වීම මුස්ලිම් ජනතාවගේ ප්‍රධාන කාර්යයක් වේ.
- රාමසාන් උත්සව දිනයේ කෙරෙන මහත් සත්ක්‍රියාවකි "සකාතුල් ෆිත්රා" නම් දානය දීම.
- පවුලේ සංඛ්‍යාව අනුව එක් අයෙකුට 2 kg බැගින් පස් දෙනෙකු සිටීනම් 10 kg දන් දිය යුතු යි.
- එම දානය දිය යුත්තේ පසුදා උදය නැමදුම අවසන් වීමට පෙර ය.

# 6 ශ්‍රේණිය - චිත්‍ර කලාව

- පහත දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1.) රාමසාන් උත්සවය සමරන ජන වර්ගය නම් කරන්න.

2.) මුස්ලිම් බැතිමතුන් විසින් ඉතා භක්තියෙන් යෙදෙන උපවාසය අරාබි වහරෙන් හඳුන්වන්නේ කෙසේ ද?

3.) උපවාසයේ යෙදීමෙන් ඔවුන් තුල වර්ධනය වන යහපත් ගුණධර්ම මොනවාද?

4.) මුස්ලිම්වරු භක්තිකයින් උපවාසයේ යෙදෙන කාලය තුල වැඩිවශයෙන් කුමක් සිදුකරයිද?

5.) රාමසාන් උත්සව දිනයේ කෙරෙන මහත් සත්ක්‍රියාව කුමක්ද?

සැකසුම: නෙලුම් රුදීකා